ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක : 2477424, 2477423, 2477418
ෆැක්ස් : 2346257, 2477739
ඊ-මේල් : dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2018 ඔක්තෝබර් 08 වැනි දින |

## විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය - 2018 ජූලි

### සමස්ත නිරීක්ෂණ

2018 ජූලි මාසයේදී ශ්‍රී ලංකාවේ විදේශීය අංශය මධ්‍යස්ථ ක්‍රියාකාරිත්වයක් වාර්තා කළේය. අපනයන ආදායම එ.ජ. ඩොලර් බිලියනයකට වඩා වැඩි වුවද, ඉහළ ආනයන වියදම නිසා පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේදී 2018 ජූලි මාසයේදී වෙළඳ හිඟය තවදුරටත් පුළුල් විය. මාසය තුළදී වාර්ෂික පදනම මත සංචාරක ඉපැයීම් මධ්‍යස්ථ වර්ධනයක් වාර්තා කළ අතර, විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ සුළු වශයෙන් අඩු විය. ජූලි මාසය තුළදී මූල්‍ය ගිණුම වෙත මධ්‍යස්ථ ලැබීම් ප්‍රමාණයක් වාර්තා වූ අතර, ණය සේවාකරණ අවශ්‍යතාවයන් සහ අනෙකුත් ගෙවීම් හේතුවෙන් 2018 ජූලි මස අවසානය වන විට දළ නිල සංචිත එ.ජ.ඩොලර් බිලියන 8.4 ක් දක්වා අඩු විය. රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙතින් සිදු වූ විදේශීය ආයෝජන ගෙවීම් සහ ආනයන සඳහා වූ විදේශ විනිමය ඉල්ලුම ඉහළ යාමත් සමඟ විදේශ විනිමය වෙළඳපොළ අඛණ්ඩව පීඩනයකට යටත්ව පැවතුන අතර, ඒ හේතුවෙන් විනිමය අනුපාතිකයේ දෛනිකව පැවති අධික විචලනයන් අවම කිරීම සඳහා මැදිහත්වීමට මහ බැංකුවට සිදු විය.

## සංඛ්‍යා සටහන 1: විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වයෙහි සාරාංශය (අ)

| කාණ්ඩය | 2017 ජූලි (එ.ජ.ඩො. මිලියන) | 2018 ජූලි (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | 2017 ජන.- ජූලි (එ.ජ.ඩො. මිලියන) | 2018 ජන.- ජූලි (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| අපනයන | 1,015 | 1,073 | 5.7 | 6,413 | 6,805 | 6.1 |
| ආනයන | 1,591 | 1,754 | 10.3 | 11,740 | 13,196 | 12.4 |
| වෙළඳ ශේෂය (ශුද්ධ) | -576 | -681 | | -5,327 | -6,391 | |
| සංචාරක ඉපැයීම් | 381 (ආ) | 404 (ඇ) | 6.0 | 2,255 (ආ) | 2,564 (ඇ) | 13.7 |
| විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ | 629 (ඈ) | 619 | -1.6 | 4,220 (ඈ) | 4,243 | 0.5 |
| කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ ලැබීම් (ශුද්ධ) (ඉ) | 23 | -3 | | 253 | 50 | |
| රාජ්‍ය අංශයේ ලැබීම් (දළ) | 289 | 72 | | 3,658 | 3,942 | |
| භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර | 204 | 29 | | 934 | 582 | |
| දිගුකාලීන ණය | 86 | 43 | | 774 | 860 | |
| ඒකාබද්ධ ණය පහසුකම් | - | - | | 450 | - | |
| ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර | - | - | | 1,500 | 2,500 | |
| ජා.මූ. අරමුදල - විස්තීර්ණ ණය පහසුකම | 167 | - | | 167 | 252 | |
| විදේශීය සෘජු ආයෝජන (ඊ) | | | | 567 | 1,353 | |
| සමස්ත ශේෂය | | | | 1,449 | 554 | |

මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, කොළඹ කොටස් වෙළඳපොළ, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය

(අ) තාවකාලික

(ආ) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් 2017 වර්ෂය සඳහා සිදු කළ සමීක්ෂණයට අනුව ඇස්තමේන්තු කළ සංචාරකයකු මෙරට ගත කරන සාමාන්‍ය කාලය සහ සංචාරකයකුගේ සාමාන්‍ය දෛනික වියදමට අනුව සංශෝධිතය

(ඇ) ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය විසින් 2018 වර්ෂය සඳහා එහි සමීක්ෂණ ප්‍රතිඵල නිකුත් කිරීමෙන් පසු මෙම තාවකාලික ඇස්තමේන්තු සංශෝධනය විය හැකිය

(ඈ) සංශෝධිත


(ඉ) ද්විතීයික සහ ප්‍රාථමික වෙළඳපොළ ගනුදෙනු ඇතුළත් වේ

(ඊ) සෑම කාලපරිච්ඡේදයක් සඳහාම දත්ත පවතිනුයේ පළමු මාස හය සඳහා වන අතර, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් වාර්තා කළ පරිදි සෘජු ආයෝජන සමාගම් වෙත වූ විදේශීය ණය සහ කොටස් වෙළඳපොළ වෙත වූ ශුද්ධ සෘජු ආයෝජන ඇතුළත් වේ

## වෙළඳ ශේෂය

2018 ජූලි මාසයේ වෙළඳ ගිණුමේ හිඟය 2017 ජූලි මාසයට සාපේක්ෂව අඛණ්ඩව පුළුල් වූ අතර, ආනයන ඉහළ යෑම මේ සඳහා හේතු විය. 2018 වසරේ පළමු මාස හත තුළ සමුච්චිත වෙළඳ හිඟය 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව කැපී පෙනෙන ලෙස පුළුල් විය.

## රූප සටහන 1: මාසික වෙළඳ ශේෂය





මූලයන් : ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

## වෙළඳ භාණ්ඩ අපනයන ක්‍රියාකාරිත්වය

2018 ජූලි මාසයේදී වෙළඳ භාණ්ඩ අපනයන ආදායම අඛණ්ඩව දෙවැනි මාසයටත් එ.ජ.ඩොලර් බිලියනය ඉක්මවීය. මේ අනුව, අපනයන ආදායම එ.ජ.ඩොලර් මිලියන 1,073 ක් දක්වා පෙර වසරට සාපේක්ෂව සියයට 5.7කින් ඉහළ ගියේය. අපනයන ආදායම ඉහළ යෑම සඳහා කාර්මික අපනයන ඉහළ යෑම හේතු වූ අතර, කෘෂිකාර්මික සහ ඛනිජමය අපනයනවල දුර්වල ක්‍රියාකාරිත්වයක් වාර්තා විය. කාර්මික අපනයන සැලකූවිට, ඛනිජ තෙල් නිෂ්පාදිත අපනයන ආදායම කැපී පෙනෙන ලෙස ඉහළ ගිය අතර, නැව් සහ ගුවන් යානා සඳහා භාවිත කරන ඉන්ධන අපනයන පරිමාව පහත වැටුණද, අපනයන මිල ගණන් ඉහළ යෑම මේ සඳහා හේතුවිය. මෙම මාසය තුළ සිංගප්පූරුව වෙත මගී ප්‍රවාහන නෞකාවක් අපනයනය කිරීම හේතුවෙන් ප්‍රවාහන උපකරණ අපනයන ආදායම සැලකිය යුතු ලෙස ඉහළ ගියේය. යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ යටතේ වර්ග කර ඇති භාණ්ඩ සියල්ලකම පාහේ අපනයන ඉහළ යෑම හේතුවෙන් 2018 ජූලි මාසයේදී යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ අපනයන ආදායම ඉහළ ගියේය. මීට අමතරව, 2018 ජූලි මාසයේදී ආහාර, පාන වර්ග හා දුම්කොළ, මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ, රසායනික නිෂ්පාදිත, මූල ලෝහ හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත සහ සත්ත්ව ආහාර අපනයන ආදායම් ඉහළ යෑම ද කාර්මික අපනයන ඉහළ යෑමට දායක විය. කෙසේ වුවද, 2018 ජූලි මාසයේදී රෙදිපිළි හා ඇඟලුම් අපනයන ආදායම සුළු වශයෙන් පහත වැටුණු අතර, ඒ සඳහා ඇමෙරිකා එක්සත් ජනපදය මෙන්ම කැනඩාව, එක්සත් අරාබි එමීර් රාජ්‍ය සහ ඕස්ට්‍රේලියාව වැනි සාම්ප්‍රදායික නොවන වෙළඳපොළ වෙතින් වූ ඉල්ලුම පහත වැටීමත් 2017 ජූලි මාසයේදී ඉහළ අපනයන ආදායමක් වාර්තාවීමෙන් වූ පදනම් බලපෑමත් හේතු විය. මේ අතර, එළවළු සහ සුළු කෘෂිකාර්මික අපනයන හැර කෘෂිකාර්මික අපනයන යටතේ වර්ග කර ඇති අනෙකුත් සියලුම අපනයනවල දුර්වල ක්‍රියාකාරිත්වය හේතුවෙන් මෙම මාසය තුළ කෘෂිකාර්මික අපනයන ආදායම පහත වැටුණි. තේ අපනයන මිල ගණන් හා පරිමාව පහත වැටීම හේතුවෙන් තේ අපනයන ආදායම පහත වැටුණු අතර, සියලුම පොල් මද ආශ්‍රිත නිෂ්පාදිතවල අපනයන මිල ගණන් ඉහළ ගියද, අපනයන පරිමාව පහත වැටීම හේතුවෙන් පොල් අපනයන ආදායම පහත වැටුණි. 2018 ජූලි මාසයේදී ශ්‍රී ලංකාවේ වෙළඳ භාණ්ඩ අපනයන සඳහා ප්‍රධාන වෙළඳපොළ ලෙස ඇමෙරිකා එක්සත් ජනපදය, එක්සත් රාජධානිය, ඉන්දියාව, ජර්මනිය සහ ඉතාලිය පැවති අතර, එම රටවල් වෙත සිදු කරන ලද අපනයන මුළු අපනයන ආදායමෙන් සියයට 48 ක් පමණ විය.

**රූප සටහන 2: මාසික අපනයන ක්‍රියාකාරිත්වය**




මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

## සංඛ්‍යා සටහන 2: වෙළඳ භාණ්ඩ අපනයන ආදායම (අ)


| කාණ්ඩය | 2017 ජුලි (එ.ජ.ඩො. මිලියන) | 2018 ජුලි (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | 2017 ජන.-ජුලි (එ.ජ.ඩො. මිලියන) | 2018 ජන - ජුලි (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **1. කාර්මික අපනයන** | **756.6** | **843.6** | **11.5** | **4,822.4** | **5,277.3** | **9.4** |
| ආහාර, පාන වර්ග හා දුම්කොළ | 33.5 | 38.8 | 15.7 | 224.3 | 271.1 | 20.8 |
| සත්ත්ව ආහාර | 4.6 | 11.9 | 157.8 | 45.2 | 66.0 | 46.1 |
| රෙදිපිළි හා ඇඟලුම් | 466.6 | 465.6 | (0.2) | 2,850.2 | 2,984.6 | 4.7 |
| එයින් ඇඟලුම් | 441.1 | 435.2 | (1.3) | 2,685.8 | 2,786.0 | 3.7 |
| රෙදිපිළි | 18.4 | 22.6 | 22.8 | 118.1 | 143.2 | 21.2 |
| වෙනත් රෙදිපිළි සැකසුම් | 7.2 | 7.9 | 10.1 | 46.3 | 55.4 | 19.6 |
| රබර් නිෂ්පාදිත | 78.5 | 77.4 | (1.5) | 467.1 | 503.8 | 7.9 |
| මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 17.4 | 19.4 | 11.5 | 141.4 | 170.9 | 20.9 |
| යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 29.1 | 38.4 | 32.1 | 209.5 | 258.3 | 23.3 |
| ප්‍රවාහන උපකරණ | 6.7 | 31.4 | 368.2 | 131.7 | 82.4 | (37.4) |
| ඛනිජ තෙල් නිෂ්පාදිත | 35.7 | 68.8 | 93.0 | 212.6 | 340.9 | 60.3 |
| රසායනික නිෂ්පාදිත | 13.7 | 17.0 | 24.2 | 83.9 | 98.8 | 17.7 |
| දැව හා කඩදාසි නිෂ්පාදිත | 11.5 | 11.1 | (3.5) | 79.0 | 81.5 | 3.2 |
| මුද්‍රණ කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 6.3 | 4.2 | (32.8) | 24.0 | 14.4 | (39.9) |
| සම්භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් | 12.8 | 13.1 | 2.6 | 90.5 | 90.6 | 0.2 |
| ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 5.5 | 5.6 | 1.4 | 41.3 | 44.2 | 6.8 |
| මූල ලෝහ හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 9.5 | 14.7 | 54.2 | 60.9 | 91.7 | 50.6 |
| පිඟන් මැටි නිෂ්පාදිත | 3.2 | 2.7 | (17.8) | 19.2 | 17.3 | (10.0) |
| වෙනත් | 22.0 | 23.5 | 6.9 | 141.6 | 160.7 | 13.5 |
| **2. කෘෂිකාර්මික අපනයන** | **253.3** | **225.7** | **(10.9)** | **1,559.7** | **1,498.0** | **(4.0)** |
| තේ | 143.0 | 125.2 | (12.4) | 871.4 | 854.2 | (2.0) |
| රබර් | 2.1 | 1.6 | (25.1) | 26.1 | 20.3 | (22.0) |
| පොල් | 32.5 | 28.2 | (13.3) | 206.3 | 178.3 | (13.6) |
| කුළුබඩු | 37.7 | 34.3 | (9.1) | 198.4 | 184.0 | (7.3) |
| එළවළු | 2.3 | 3.5 | 51.6 | 16.9 | 16.0 | (5.3) |
| සකස් නොකළ දුම්කොළ | 3.6 | 3.0 | (16.5) | 20.0 | 19.8 | (0.9) |
| සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත | 11.8 | 11.9 | 1.2 | 83.2 | 74.0 | (11.0) |
| මුහුදු ආහාර | 20.3 | 18.0 | (11.2) | 137.4 | 151.4 | 10.2 |
| **3. ඛනිජ හා වෙනත් අපනයන** | **5.3** | **3.9** | **(26.0)** | **30.6** | **29.8** | **(2.9)** |
| **මුළු අපනයන** | **1,015.2** | **1,073.2** | **5.7** | **6,412.7** | **6,805.0** | **6.1** |

මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා අනෙකුත් ඛනිජ තෙල් අපනයනකරුවන්, ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) තාවකාලික

## වෙළඳ භාණ්ඩ ආනයන ක්‍රියාකාරිත්වය

රූප සටහන 3: මාසික ආනයන ක්‍රියාකාරිත්වය




මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ශ්‍රී ලංකා මහ බැංකුව

2018 ජූලි මාසයේදී ආනයන වියදම එ.ජ.ඩොලර් මිලියන 1,754 ක් දක්වා පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 10.3 කින් ඉහළ ගියේය. මෙම වර්ධනය සඳහා මාසය තුළ සියලුම ප්‍රධාන කාණ්ඩවල ආනයන පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව ඉහළ යෑමත්, පදනම් බලපෑමත් හේතු විය. අන්තර් භාණ්ඩ සැලකූ විට, බොර තෙල් සහ පිරිපහදු කළ ඛනිජ තෙල් මිල ගණන් ඉහළ යෑම හේතුවෙන් ඉන්ධන ආනයන වියදම කැපී පෙනෙන ලෙස ඉහළ ගියේය. 2018 ජූලි මාසයේදී නූල් සහ රෙදි ආනයන වියදම ඉහළ යෑම හේතුවෙන් රෙදිපිළි හා රෙදිපිළි උපාංග ආනයන වියදම ඉහළ ගියේය. මේ අතර, යකඩ හා වානේ ආනයනය සඳහා වූ වියදම ඉහළ යෑම හේතුවෙන් මෙම මාසය තුළ මූල ලෝහ ආනයන වියදම ඉහළ ගියේය. තවද, 2018 ජූලි මාසයේදී රසායනික නිෂ්පාදිත, ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත, පොහොර සහ සකස් නොකළ දුම්කොළ ආනයන වියදම ඉහළ යෑමද අන්තර් භාණ්ඩ ආනයන ඉහළ යෑම සඳහා දායක විය. කෙසේ වුවද, රත්‍රන් ආනයන මත සියයට 15 ක තීරු බද්දක් පැනවීම හේතුවෙන් 2018 ජූලි මාසයේදී රත්‍රන් ආනයන වියදම අඛණ්ඩව තෙවැනි මාසයටත් පහත වැටුණි. එසේම, තිරිඟු හා ඉරිඟු සහ ආහාර සැකසුම් ආනයන වියදම පහත වැටීම මෙම මාසය තුළදී අන්තර් භාණ්ඩ ආනයන වියදම මත වූ පීඩනය අඩු කිරීමට දායක විය. මේ අතර, ප්‍රධාන වශයෙන්ම සිලින්ඩර ධාරිතාව 1,000 ට අඩු මෝටර් රථ, දෙමුහුන් රථ සහ විද්‍යුත් මෝටර් රථ වැනි පෞද්ගලික භාවිතය සඳහා වන රථ වාහන ආනයනය ඉහළ යෑම හේතුවෙන් පාරිභෝගික භාණ්ඩ ආනයනය ඉහළ ගියේය. සිලින්ඩර ධාරිතාව අඩු මෝටර් රථ ආනයනය සීමා කිරීම සඳහා මෙම කාණ්ඩ මත වන බදු 2018 අගෝස්තු 01 දින සිට බලපැවැත්වෙන පරිදි ඉහළ දමන ලදී. තවද, 2018 සැප්තැම්බර් 19 දින සිට බලපැවැත්වෙන පරිදි වාණිජ කටයුතු සඳහා භාවිතයට ගනු ලබන රථවාහන හැර අනෙකුත් රථවාහන ආනයන සඳහා වාණිජ බැංකුවල ණයවර ලිපි විවෘත කිරීමේදී සියයට සියයක ආන්තික මුදල් තැන්පතු අවශ්‍යතාවක් පනවන ලදී. ආනයන ඉහළ යාම හේතුවෙන් ගෙවුම් තුලනය මත අඛණ්ඩව පවතින පීඩනය සැලකිල්ලට ගනිමින් රජය සහ මහ බැංකුව විසින් තවදුරටත් රථවාහන සහ ඇතැම් අත්‍යවශ්‍ය නොවන පාරිභෝගික භාණ්ඩ ආනයනය සීමා කිරීමට ක්‍රියාමාර්ග ගන්නා ලදී. කෙසේ වුවද, මහ කන්නයේදී සරු අස්වැන්නක් ලැබීම හේතුවෙන්, සහල් ආනයනය පහත වැටීම නිසා 2018 ජූලි මාසයේදී ආහාර හා පාන වර්ග ආනයන වියදම පහත වැටුණි. මේ අතර, යන්ත්‍රසූත්‍ර හා උපකරණ, ගොඩනැගිලි ද්‍රව්‍ය සහ ප්‍රවාහන උපකරණ ආනයනය ඉහළ යෑම හේතුවෙන් ආයෝජන භාණ්ඩ ආනයන වියදම ඉහළ ගියේය. 2018 ජූලි මාසයේදී ශ්‍රී ලංකාව විසින් භාණ්ඩ ආනයනය කළ ප්‍රධාන රටවල් ලෙස ඉන්දියාව, චීනය, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, ජපානය සහ සිංගප්පූරුව පැවති අතර, එම රටවලින් සිදු කළ ආනයන සමස්ත ආනයන වියදමෙන් සියයට 62 ක් පමණ විය.

## සංඛ්‍යා සටහන 3: වෙළඳ භාණ්ඩ ආනයන වියදම (අ)

| කාණ්ඩය | 2017 ජූලි (එ.ජ.ඩො. මිලියන) | 2018 ජූලි (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | 2017 ජන. - ජූලි (එ.ජ.ඩො. මිලියන) | 2018 ජන. - ජූලි (එ.ජ.ඩො මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **1. පාරිභෝගික භාණ්ඩ** | **334.5** | **389.4** | **16.4** | **2,556.3** | **3,010.1** | **17.8** |
| ආහාර හා පාන වර්ග | 133.1 | 112.5 | (15.5) | 1,056.6 | 1,019.5 | (3.5) |
| ධාන්‍ය හා ඇඹරුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 24.2 | 1.8 | (92.6) | 162.3 | 111.5 | (31.3) |
| එයින් සහල් | 23.3 | 0.4 | (98.4) | 155.1 | 100.5 | (35.2) |
| එළවළු | 26.2 | 25.1 | (4.0) | 202.9 | 195.1 | (3.8) |
| කිරි නිෂ්පාදිත | 19.6 | 23.6 | 20.5 | 180.0 | 190.3 | 5.7 |
| සීනි හා රසකැවිලි | 18.9 | 19.1 | 0.8 | 169.6 | 171.9 | 1.4 |
| මුහුදු ආහාර | 18.3 | 12.1 | (33.9) | 129.1 | 116.7 | (9.6) |
| කුළුබඩු | 5.6 | 10.2 | 81.3 | 56.3 | 62.1 | 10.2 |
| තෙල් සහ මේදය | 2.8 | 4.1 | 43.1 | 27.4 | 31.2 | 14.2 |
| වෙනත් ආහාර හා පාන වර්ග | 17.5 | 16.5 | (5.5) | 129.1 | 140.6 | 8.9 |
| ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | 201.3 | 276.9 | 37.5 | 1,499.7 | 1,990.6 | 32.7 |
| පෞද්ගලික රථවාහන | 62.2 | 137.0 | 120.4 | 432.4 | 949.7 | 119.7 |
| බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත | 41.7 | 40.9 | (1.8) | 290.4 | 299.7 | 3.2 |
| මුද්‍රිත නිෂ්පාදිත හා ලිපිද්‍රව්‍ය | 2.7 | 3.8 | 42.9 | 20.1 | 22.2 | 10.2 |
| රෙදිපිළි හා උපාංග | 22.4 | 24.4 | 9.2 | 221.2 | 189.5 | (14.3) |
| ගෘහ උපකරණ | 18.6 | 18.1 | (3.0) | 146.9 | 138.1 | (6.0) |
| ගෘහ හා දැව භාණ්ඩ | 16.9 | 13.1 | (22.7) | 98.6 | 97.2 | (1.4) |
| රබර් නිෂ්පාදිත | 7.6 | 9.0 | 19.1 | 52.3 | 54.3 | 3.7 |
| ආලේප වර්ග හා සේදුම් ද්‍රව්‍ය | 5.5 | 4.7 | (14.4) | 48.9 | 40.7 | (16.8) |
| වෙනත් ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | 23.8 | 25.8 | 8.5 | 188.8 | 199.2 | 5.5 |
| **2. අන්තර් භාණ්ඩ** | **901.8** | **975.3** | **8.1** | **6,250.9** | **7,295.2** | **16.7** |
| ඉන්ධන | 215.9 | 276.6 | 28.1 | 1,840.4 | 2,370.2 | 28.8 |
| එයින් බොරතෙල් | 34.8 | 55.1 | 58.3 | 314.2 | 486.4 | 54.8 |
| පිරිපහදු කළ ඛනිජ තෙල් | 180.7 | 221.5 | 22.6 | 1,355.0 | 1,736.6 | 28.2 |
| දියමන්ති, අගනා ගල් හා ලෝහ වර්ග | 72.1 | 13.3 | (81.6) | 400.1 | 508.4 | 27.1 |
| එයින් රත්‍රන් | 62.4 | 0.1 | (99.8) | 337.4 | 437.9 | 29.8 |
| රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 236.9 | 249.6 | 5.3 | 1,543.9 | 1,610.1 | 4.3 |
| මූල ලෝහ | 48.8 | 91.9 | 88.3 | 300.7 | 381.0 | 26.7 |
| රසායනික නිෂ්පාදිත | 66.8 | 78.5 | 17.6 | 475.0 | 524.6 | 10.4 |
| ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත | 48.8 | 58.8 | 20.5 | 351.4 | 411.8 | 17.2 |
| රබර් හා ඒ ආශ්‍රිත උපාංග | 26.1 | 24.8 | (4.9) | 168.3 | 151.3 | (10.1) |
| රථවාහන හා යන්ත්‍ර කොටස් | 23.6 | 23.2 | (2.0) | 171.5 | 175.2 | 2.2 |
| තිරිඟු හා ඉරිඟු | 31.4 | 19.0 | (39.5) | 193.9 | 212.1 | 9.4 |
| ආහාර සැකසුම් | 30.6 | 18.1 | (40.9) | 177.4 | 180.3 | 1.7 |
| පොහොර | 10.6 | 17.6 | 66.1 | 49.7 | 138.7 | 179.1 |
| සකස් නොකළ දුම්කොළ | 4.7 | 12.8 | 173.7 | 31.7 | 44.5 | 40.3 |
| වෙනත් | 85.5 | 91.1 | 6.6 | 547.0 | 587.0 | 7.3 |
| **3. ආයෝජන භාණ්ඩ** | **351.9** | **386.3** | **9.8** | **2,799.0** | **2,818.7** | **0.7** |
| යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 195.0 | 216.4 | 11.0 | 1,514.0 | 1,480.3 | (2.2) |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 111.3 | 119.6 | 7.5 | 900.9 | 878.8 | (2.5) |
| ප්‍රවාහන උපකරණ | 45.1 | 50.0 | 10.8 | 378.9 | 455.9 | 20.3 |
| වෙනත් ආයෝජන භාණ්ඩ | 0.5 | 0.4 | (31.9) | 5.3 | 3.7 | (29.6) |
| **4. වර්ග නොකළ ආනයන** | **3.0** | **3.5** | **18.1** | **133.9** | **71.5** | **(46.6)** |
| **මුළු ආනයන** | **1,591.1** | **1,754.5** | **10.3** | **11,740.1** | **13,195.5** | **12.4** |

මූලයන්: ශ්‍රී ලංකා රේගුව, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා අයි.ඕ.සී. සමාගම, ශ්‍රී ලංකා මහ බැංකුව


(අ) තාවකාලික

## ජංගම ගිණුම වෙත වාර්තා වූ අනෙකුත් ප්‍රධාන ලැබීම්

සාමාන්‍යයෙන් වසරේ සංචාරකයින් අඩුවෙන් පැමිණෙන කාලයක් වුවද, 2018 වසරේ ජූලි මාසයේ දී සංචාරක පැමිණීම් සියයට 6.0 ක මධ්‍යස්ථ වර්ධනයක් වාර්තා කළ අතර, පැමිණි සංචාරකයින් සංඛ්‍යාව 217,829 ක් විය. 2018 වසරේ පළමු මාස හත තුළදී පැමිණි මුළු සංචාරකයින් සංඛ්‍යාව 1,382,476 ක් වූ අතර, එය 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේදී සියයට 13.7 ක වැඩිවීමකි. 2018 වසරේ ජූලි මාසයේදී සංචාරක ඉපැයීම් එ.ජ.ඩොලර් මිලියන 404 ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර, 2018 වසරේ පළමු මාස හත තුළ මුළු සංචාරක ඉපැයීම් ප්‍රමාණය එ.ජ.ඩොලර් මිලියන 2,564 ක් විය. ඉන්දියාව, එක්සත් රාජධානිය, නෙදර්ලන්තය, ඔස්ට්‍රේලියාව සහ එක්සත් ජනපදය යන රටවල්වලින් පැමිණි සංචාරක පැමිණීම්හි වර්ධනය, කාලපරිච්ඡේදය තුළ මුළු සංචාරක පැමිණීම්වල වර්ධනය සඳහා දායක විය.


මේ අතර, 2018 වසරේ ජූලි මාසයේදී විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ පෙර වසරේ ජූලි මාසයට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 619 ක් දක්වා සියයට 1.6 කින් පහත වැටුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, සමුච්චිත පදනම මත ගත් කළ, 2018 වසරේ පළමු මාස හත තුළදී විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ, 2017 වසරේ පළමු මාස හත හා සැසඳීමේදී එ.ජ.ඩොලර් මිලියන 4,243 ක් දක්වා සියයට 0.5 කින් වර්ධනය විය.

**රූප සටහන 4 : සංචාරක පැමිණීම්හි ප්‍රධාන මූලාශ්‍ර පහ**




මූලය: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය

**රූප සටහන 5 : සංචාරක ඉපැයීම් සහ විදේශසේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ**




මූලයන්: ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය
බලපත්‍රලාභී වාණිජ බැංකු
ශ්‍රී ලංකා මහ බැංකුව

## මූල්‍ය ලැබීම්


ප්‍රාථමික සහ ද්විතියික වෙළඳපොළ විදේශ විනිමය ගනුදෙනු ඇතුළත්ව කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ විදේශ ආයෝජන, 2018 වසරේ ජූලි මාසයේදී එ.ජ.ඩොලර් මිලියන 3 ක ශුද්ධ ගෙවීමක් වාර්තා කළේය. එහි ප්‍රතිඵලයක් ලෙස කාලපරිච්ඡේදය තුළදී ද්විතියික වෙළඳපොළ වෙතින් වූ එ.ජ.ඩොලර් මිලියන 16 ක ශුද්ධ ගෙවීම සහ ප්‍රාථමික වෙළඳපොළ වෙත වූ එ.ජ.ඩොලර් මිලියන 66 ක ලැබීම් සමඟ 2018 වසරේ පළමු මාස හත තුළදී කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ මුළු විදේශ ආයෝජන එ.ජ.ඩොලර් මිලියන 50 ක ශුද්ධ ලැබීමක් වාර්තා කරන ලදී.

ගෝලීය මූල්‍ය වෙළඳපොළ තුළ සිදුවූ මෑතකාලීන වර්ධනයන්, විශේෂයෙන්ම එක්සත් ජනපද ආර්ථිකයෙහි ශක්තිමත් වීම සමඟ ෆෙඩරල් සංචිත බැංකුවෙහි ප්‍රතිපත්ති පොලී අනුපාතික ඉහළ නැංවීම, නැගී එන ආර්ථිකයන්හි ප්‍රාග්ධන වෙළඳපොළ වෙතින් විදේශීය ආයෝජන පිටතට ගලායෑමට හේතු විය. මෙම තත්ත්වය ශ්‍රී ලංකාවටද බලපෑ අතර, විශේෂයෙන්ම 2018 වසරේ තුන්වන කාර්තුවේදී, රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙතින් විදේශීය ආයෝජන අඛණ්ඩව ඉවත් කර ගැනීමක් සිදුවිය. එහි ප්‍රතිඵලයක් ලෙස, 2018 ජූලි මාසය සඳහා එ.ජ.ඩොලර් මිලියන 53 ක ශුද්ධ ගෙවීමක් වාර්තා කළ අතර, 2018 වසරේ පළමු මාස හත තුළදී රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙතින් එ.ජ.ඩොලර් මිලියන 229 ක ශුද්ධ ගෙවීමක් වාර්තා විය.

## ජාත්‍යන්තර සංචිත

2018 වසරේ ජූලි මාසය අවසානයේදී දළ නිල සංචිත ප්‍රමාණය එ.ජ.ඩොලර් බිලියන 8.4 ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර, එය මාස 4.5 ක ආනයන හා සමාන වේ. දළ නිල සංචිත සහ බැංකු අංශයේ විදේශ වත්කම් ඇතුළත් මුළු විදේශීය වත්කම් ප්‍රමාණය, 2018 වසරේ ජූලි මස අවසානය වන විට මාස 5.8 ක ආනයන හා සමාන වන පරිදි එ.ජ.ඩොලර් බිලියන 10.8 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත.

**රූප සටහන 6 : දළ නිල සංචිත සහ සමස්ත ශේෂය**





මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## විනිමය අනුපාතිකයේ හැසිරීම

2018 වසරේ ඔක්තෝබර් 08 වැනි දින දක්වා කාලපරිච්ඡේදය තුළදී ශ්‍රී ලංකා රුපියල, එ.ජ.ඩොලරයට සාපේක්ෂව සියයට 10.2 කින් අවප්‍රමාණය විය. තවද, අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල්වල හැසිරීම පිළිබිඹු කරමින් මෙම කාලපරිච්ඡේදය තුළදී ශ්‍රී ලංකා රුපියල, ඉන්දියානු රුපියල හැර අනෙකුත් ප්‍රධාන ව්‍යවහාර මුදල් ඒකකවලට සාපේක්ෂව අවප්‍රමාණය විය. ජාත්‍යන්තර වශයෙන් එ.ජ.ඩොලරයෙහි ශක්තිමත් වීම, එ.ජ.ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලෙහි අවප්‍රමාණය වීම කෙරෙහි වැඩි වශයෙන් බලපෑවේය.

**රූප සටහන 7 :**
**එ.ජ. ඩොලරයට සාපේක්ෂව රුපියලෙහි අගය**




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**සංඛ්‍යා සටහන 4 :**
**තෝරාගත් ව්‍යවහාර මුදල් ඒකකවලට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලෙහි වෙනස්වීම**

| මුදල් ඒකකය | 2017 | 2018 ඔක්. 08 දක්වා අතිප්‍රමාණය (+) / අවප්‍රමාණය (-) |
|---|---|---|
| එ.ජ. ඩොලරය | -2.0% | -10.2% |
| යුරෝ | -13.5% | -6.9% |
| ස්ටර්ලින් පවුම | -10.5% | -8.0% |
| ජපන් යෙන් | -5.1% | -9.4% |
| කැනේඩියානු ඩොලරය | -8.6% | -7.4% |
| ඕස්ට්‍රේලියානු ඩොලරය | -9.0% | -0.8% |
| ඉන්දියානු රුපියල | -7.5% | +3.3% |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව